# මාධ්‍ය නිවේදනය

## *නීතියේ ආධිපත්‍ය පිළිබඳ ශක්‍යතා වර්ධන සහාය පිළිබඳ අවබෝධතා ගිවිසුමට ශ්‍රී ලංකාව හා ඇමරිකා එක්සත් ජනපදය අත්සන් තබති*

ශ්‍රී ලංකාව හා ඇමරිකා එක්සත් ජනපදය, නීතියේ ආධිපත්‍ය පිළිබඳ ශක්‍යතා වර්ධන සහාය පිළිබඳ අවබෝධතා ගිවිසුමට අද දින (29/9) අත්සන් තැබූහ. එක්සත් ජනපද තානාපති අතුල් කේෂාප් මැතිතුමා හා වැඩ බලන විදේශ කටයුතු  අමාත්‍ය ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමා විසින් කොළඹ විදේශ කටයුතු අමාත්‍යාංශයේ දී මෙයට අත්සන් තබන ලදී.

එක්සත් ජනපද රාජ්‍ය ලේකම් ජෝන් කෙරී මහතා  2015 මැයි මස නිරත වූ ශ්‍රී ලංකා සංචාරයේ දී,  මූල්‍ය, වංචා, අල්ලස් හා දූෂණ, මත්ද්‍රව්‍ය නීතිවිරෝධී ලෙස ප්‍රවාහනය හා වෙනත් සංකීර්ණ අපරාධ ඇතුළුව සංවිධානාත්මකව සිදුකරනු ලබන බරපතල අපරාධ විමර්ශනය කිරීම සඳහා වගකීම දරන ශ්‍රී ලාංකික නිලධාරීන්ට උසස් පුහුණුවක් ලබාදීම සඳහා සහාය ලබාදෙන ලෙස විදේශ කටයුතු අමාත්‍ය මංගල සමරවීර මැතිතුමා විසින් ඉල්ලීමක් කරන ලදී. විමර්ශන කිරීමේ, අභිචෝදනය කිරීමේ හා විනිශ්චය කිරීමේ විශේෂිත කුසලතා, අදාළ නෛතික ක්‍රමවේදයන් වැඩිදියුණු කිරීම පිළිබඳ තාක්ෂණික සහාය සහ සංකීර්ණ හා දේශ සීමා ඉක්මවා සිදුකරන අපරාධ විමර්ශනය සඳහා වගකීම දරන රජයේ බලධාරීන්ගේ මෙහෙයුම් ඵලදායිතාව වැඩි දියුණු කිරීම පිළිබඳ දේශීය වශයෙන් හැකියාව වර්ධනයෙහි ලා මෙම අවබෝධතා ගිවිසුම මගින් විධිවිධාන සලසනු ලැබේ.

බරපතල අපරාධවලට එරෙහිව කටයුතු කිරීමේ දී හා නීතියේ ආධිපත්‍ය ක්‍රියාත්මක කිරීමේ දී දේශීය ශක්‍යතාව වැඩිදියුණු කිරීම සඳහා උපකාරීවන මෙම වැඩසටහන යටතේ ඇමරිකානු ඩොලර් මිලියන 2.6 ක එක්සත් ජනපද රජය වෙන්කර තිබේ. මෙම අවබෝධතා ගිවිසුම, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ රජය යටතේ ශ්‍රී ලංකාව හා ඇමරිකා එක්සත් ජනපදය අතර ඇති කරගනු ලබන සමීප සහයෝගිතාවයේ තවත් එක් සන්ධිස්ථානයක් වෙයි.

*විදේශ කටයුතු අමාත්‍යාංශය*
*කොළඹ*
2015.09.29